
# මා සමඟ ගස් වැල්



අනුකි සෙනායා ඒකනායක 3 A

කෘතියේ නම: මා සමඟ ගස් වැල්

කතෘගේ නම: අනුකි සෙනායා ඒකනායක

කතෘගේ වෙනත් කෘති :

- හිතුවක්කාර කුරුලු පැටියා
- ආඩම්බර රෝස මල
- ලුමිණි බබා සහ ආච්චි
- මල්ලී පුදුම වෙලා

කෘතිය පළකරන දිනය: 15.11.2023

ISBN අංකය: 978-624-206-709-4

# පිදුම

මා ඇති දැඩි කරමින් පාසල් යවන මගේ ආදරණීය අම්මාටත්, අප්පච්චීටත්....

මට අකුරු කියාදෙන ආදරණීය ගුරු දෙමාපියන්ටත් ....

හොඳ දේ කියා දෙමින් මා ආදරයෙන් රැක බලා ගන්නා ආච්චීටත්, අත්තම්මාටත්, අත්තාටත්, දිව්‍යලෝකයේ සිටින සීයාටත් ....

දඟ වැඩ කළත්, රණ්ඩු කළත් මට ආදරේ මගේ පුංචි මල්ලීටත් ....

පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

# 1. මගේ නිල් කටරොලු වැල්



මම වයස අවුරුදු පහේදි මුලින් ම සිටෙව්වෙ නිල් කටරොලු ඇට ටිකක්. ඒ කාලය වැහි කාලයක් නිසා වැල් ටික ඉක්මනින් උස ගියා.

ටික දවසකින් නිල් පාට ලස්සන මල්

පිපුණා. මට හරි ම සතුටුයි.

මම ඒ මල් කඩලා අත්තම්මාට දුන්නා.

අත්තම්මා ඒ මල්වලින් ටිකක් පූජා කළා.

අනිත් ටිකෙන් යුෂ අරගෙන දෙහි යුෂ,

සීනි, ලුණු එහෙම දාලා රස ම රස නිල්

කටරොලු බීම එකක් හැදුවා.

අපි හරි ම ආසාවෙන් ඒවා බිව්වා.

මගේ මල්ලිගේ තුන් වෙනි උපන්දිනේ දවසේ අත්තම්මා තවත් පුදුම හිතෙන දෙයක් කරලා තිබුණා.



ලා නිල් පාට කිරිබත් එකක් හදලා

තිබුණා.

ඒකටත් දාලා තියෙන්නේ මගේ නිල්

කටරොලු මල්වලින් අරගත්ත යුෂ ලු.

ඉතින් අපි හැමෝ ම රස ම රස,

ගුණ ම ගුණ ඒ කිරිබත් රස කර කර

කෑවා.



## 2. මගේ පුංචි ජම්බු පැළය

මහාමායා විදුහලේ එක වසරට ඇතුළු වෙන දවසේ මට ඉස්කෝලෙන් ලැබුණේ පුංචි ජම්බු පැළයක්.

අප්පච්චී ගෙවත්තේ වළක් කපලා දුන්නා.

මම ඒ පුංචි පැළය සිටෙවුවා.

අම්මා වතුර දැම්මා.

එතකොට මට වයස අවුරුදු පහයි.

ටික ටික උස යනකොට පුංචි ජම්බු

පැළයේ කොළ දික්වුණා විතරක් නෙවෙයි

මගේ උසට ම ජම්බු ගස උසත් ගියා.

මට හරිම සතුටුයි.



දැන් මට වයස අවුරුදු හතයි.

මම බලන් ඉන්නේ කවදද මගේ පුංචි

ජම්බු ගහේ මල් පිපිලා ගෙඩි

හැදෙන්නෙ කියලා.

# 3. මගේ ළූණු පාත්තිය



ඒ දවස්වල කොරෝනා නිසා අපිට

ඉස්කෝලෙ තිබුණෙ නෑ.

අත්තම්මා ඒ කාලේ එළවලු පාත්ති

හදනවා.

ඒක දැකලා මටත් ආසා හිතුණා.

මම මගේ පාත්තිය හැදුවේ මගේ

කාමරේ ළඟමයි.

මම මුල් ඇවිත් තිබුණු ළෑණු

සිටෙව්වා. ඒවයින් ඉක්මනට කොළ

ආවා. බලන්න හරිම ලස්සනයි.



අත්තම්මත් එක්ක මම ළූණු කොළ

කපලා වට්ටියකට දැම්මා.

අත්තම්මා ඒවයින් රස සම්බෝලක්

හැදුවා. ඒවා නිසා බත් එක රස වුණා.

අම්මා "හොඳ බබා" කියලා මගේ

ඔළුව අත ගෑවා.



මගේ නිල් කටරොලු වැල්





මල්ලිගේ උපන්දිනය දා සෑදු නිල් කිරිබත්



මගේ ජම්බු පැළය දැන් මටත් වඩා උසයි



මගේ ළූණු පාත්තිය



## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ පීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01